# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.13 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/720/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

### 01. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - දෙහිඅත්තඅණ්ඩිය පොලිස් වසම.

2025.04.12 වන දින සවස් කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ පරගස්වැවේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට ලද දෙහිඅත්තකණ්ඩිය පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශයේ පදිංචි රාජ්‍ය බුද්ධි සේවා මූලස්ථානයට අනුයුක්තව රාජකාරි කළ පොලිස් කොස්තාපල්වරයෙකි.**

මියගිය කොස්තාපල්වරයා මිතුරන් කිහිපදෙනෙකු සමඟ දිය නෑමට ගොස් සිටියදී මෙලෙස දියේ ගිලී ඇති බවට දැනට සිදුකරන ද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය දෙහිඅත්තකණ්ඩිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැම්පත් කර ඇති අතර, දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2025.04.12 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 24 හා 29 වයස්වල පසු වන බඩෝවිට සහ රත්මලාන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.

2025.04.12 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2025.04.12 වන දින සවස් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ මහදෙනිය ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 25 ක් වන ඕරුවල, අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.04.12 වන දින දහවල් කාලයේ බොරැල්ල පොලිස් වසමේ ගෝතමී පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 520 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 60 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මිනුවන්ගොඩ පොලිස් ස්ථානය.**

2025.04.12 වන දින උදෑසන කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ ගනිහිමුල්ල ප්‍රදේශයේදී මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 150 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන දංගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෘත ශරීරයක් හමුවීම - කළුතර උතුර පොලිස් වසම.**

2025.04.12 වන දින සවස් කාලයේ කළුතර උතුර පොලිස් වසමේ කැලිඩෝ වෙරළ තීරයට කාන්තා මළ සිරුරක් ගොඩගසා ඇති බවට කළුතර උතුර පොලිස් ස්ථානානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරියගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරුවී නොමැත.**

මරණකාරිය වයස අවුරුදු 49 ක් පමණ වන අතර කොණ්ඩය අඟල් 10 ක් පමණ වාවා ඇත.මරණකාරියගේ බවට සැක කරන අත් බෑගයක් සොයාගෙන ඇත. කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෘත ශරීරයක් හමුවීම - කුරුණෑගල පොලිස් වසම.**

2025.04.12 වන දින රාත්‍රී කාලයේ කුරුණෑගල පොලිස් වසමේ ජයන්තිපුර මාගර්යේ පුද්ගලයෙකු තුවාල සහිතව වැටී සිටින බවට කුරුණෑගල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත සිදු කළ පරීක්ෂාවේ දී එම පුද්ගලයා මියගොස් සිට ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරුවී නොමැත.**

මරණකරු වයස අවුරුදු 55 ක් පමණ වන උස අඩි 05 අඟල් 06 ක් පමණ වේ.කොණ්ඩය කොටට කපා ඇති අතර නිල් පැහැති අත් දිග කමිසයක් හා බොටම් කලිසමක් හැඳ සිටී. මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කුරුණෑගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 09. **දුම්රියක ගැටී පුද්ගලයෙකු තුවාල ලැබීම - ගම්පොල පොලිස් වසම.**

2025.04.13 වන අද දින අළුයම් කාලයේ ගම්පොල පොලිස් වසමේ බෝතලාපිටිය ප්‍රදේශයේදී කොළඹ සිට බදුල්ල දක්වා ධාවනය වූ රාත්‍රී තැපැල් දුම්රියේ පුද්ගලයෙකු ගැටී බරපතල තුවාල ලබා ගම්පොල රෝහලට ඇතුළත් කර ඇති බවට ගම්පොල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 35 ක් වන ඉලංගවත්ත, ගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පොල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**